Lesson 67 **අභිරහස් කළුගල**

Mysterious Kalugala

"Where's Nadun ?" Ashen asked in a surprised tone.
“වෙයා(ර්)ස් නදුන් ?” අශේන් ආස්ක්ඩ් ඉන් අ සප්‍රයිස්ඩ් ටෝන්
“කෝ නදුන් ?” පුදුමයට පත් ස්වරයෙන් අශේන් ඇසුවේය .

"He didn't come," Dinal said, quite worried. "I waited for an hour. Finally, I decided to come without him."
“හී ඩිඩ්න්ට් කම් . දිනාල් සේඩ් ක්වයිට් වොරීඩ් . “අයි වේටඩ් ෆෝ ඇන් අව(ර්) . ෆයිනලි අයි ඩිසයිඩඩ් ටු කම් විතවුට් හිම් “
“එයා ආවේ නෑ .” දිනාල් තරමක් ව්‍යාකුල බවකින් කීවේය . මම පැයක් බලන් හිටියා , අන්තිමට එයා නැතුව මම එන්න තීරණය කළා “

"Oh gosh ! Surely his mother didn't permit him to come," Ashen said.
“ඕ ගොෂ් ! ෂුව(ර්)ලි හිස් මද(ර්) ඩිඩ්න්ට් ප(ර්)මිට් හිම් ටු කම් “ අශේන් සේඩ්
අපොයි ! එකත් එකටම(නිසැකවම ) එයාගේ අම්මා එයාට එන්න අවසර දෙන්න නැතුව ඇති “. අශේන් කීවේය (permit - අවසර දෙනවා )

"What can we do now ?" asked Shamal.
“වට් කැන් වී ඩූ නව් ? “ ආස්ක්ඩ් ශමල්
“දැන් අපි මොකද කරන්නේ ?” ශමල් ඇසුවේය

"We can go without him," said Ashen.
“වී කැන් ගෝ විතවුට් හිම්” සේඩ් අශේන්
“අපිට එයා නැතුව යන්න පුළුවන්” අශේන් කීවේය

"What if he comes here after we have left?" asked Sumal, quite puzzled.
“වට් ඉෆ් හී කම්ස් හියර්) ආෆ්ට(ර්) වී හැව් ලෙෆ්ට් .” ආස්ක්ඩ් සුමල් , ක්වයිට් පස්ල්ඩ්

“අපි ගියාට පස්සේ එයා ආවොත් මොකද වෙන්නේ ? “ තරමක් ගැටලුකාරීව සුමල් ඇසුවේය (puzzle- ප්‍රෙහෙලිකාව / puzzled - ප්රෙහෙලිකවකට මැදිවූ , ගැටලුකාරී තත්වයකට මුහුණ දුන් )
[ waht if කියන්නේ “එහෙම වුනොත් මොකද වෙන්නේ “ වැනි අදහසක් දෙන්න පාවිච්චි කරන හොඳ යෙදුමක් ]

"Never mind, He had enough time to come. We shouldn't wait anymore. We have to come back before nightfall. Come on, let's go," Ashen said .

“නෙව(ර්) මයින්ඩ් , හී හෑඩ් ඉනෆ් ටයිම් ටු කම්. වී ෂුඩ්න්ට් වේට් එනිමෝ . වී හැව් ටු කම් බැක් බිෆෝ නයිට් ෆෝල්. කමෝන් , ලෙට්ස් ගෝ “. අශේන් සේඩ්

“කමක් නෑ , එයාට එන්න ඕන තරම් වෙලාව තිබුනා. අපි තවත් බලන් ඉන්න ඕන නෑ . රෑ වෙන්න කලින් අපි එන්නත් ඕන . එන්න , අපි යමු “ අශේන් කීවේය (nightfall -ඇඳිරි වැටීම/ රාත්‍රිය උදා වීම )

The four boys set off on their adventure. Ashen, Shamal, Dinal, Sumal, and Nadun were 14-year-old students in the same class at school. They had planned this adventure to climb Kalugala mountain
ද ෆෝ බෝයිස් සෙට් ඕෆ් (සෙටෝෆ්) ඔන් දෙයා(ර්) ඇඩ්වෙන්ච(ර්). අශේන් , දිනාල් , ශමල් , සුමල් ඇන්ඩ් නදුන් ව(ර්) ෆෝටීන් ඉය(ර්) ඕල්ඩ් ස්ටුඩන්ට්ස් ඉන් ද සේම් ක්ලාස් ඇට් ස්කූල් . දේ හෑඩ් ප්ලෑන්ඩ් දිස් ඇඩ්වෙන්ච(ර්) ටු ක්ලයිම් කළුගල මවුන්ටන්

පිරිමි ළමයි හතර දෙනා ඔවුන්ගේ වීර චාරිකාව සඳහා පිටත් වූහ .අශේන් , ශමල් , දිනාල් ,සුමල් සහ නදුන් පාසලේ එකම පන්තියේ සිටි 14 හැවිදිරි ශිෂ්‍යයන්ය . කලුගල කන්ද නැගීමට මේ වීර චාරිකාව ඔවුන් සැලසුම් කොට තිබුණි .

They had wanted to climb this mountain for a long time.They had heard many stories about it. The mountain was within sight of their school, but they had to walk at least two kilometers through the jungle to reach its foot.
දේ හෑඩ් වෝන්ටඩ් ටු ක්ලයිම් දිස් මවුන්ටන් ෆෝ අ ලෝං ටයිම්. දේ හෑඩ් හ(ර්)ඩ් මෙනි ස්ටෝරීස් අබවුට් ඉට් . ද මවුන්ටන් වෝස් විතින් සයිට් ඔෆ් දෙයා(ර්) ස්කූල් බට් දේ හෑඩ් ටු වෝක් ඇට් ලීස්ට් ටූ කිලෝ මීට(ර්)ස් ත්රූ ද ජංගල් ටු රීච් ඉට්ස් ෆූට්

දීර්ඝ කාලයක සිට ඔවුන්ට මේ කන්ද නැගීමට අවශ්‍යව තිබුණි .ඔවුන් ඒ පිලිබඳ බොහෝ කතා අසා තිබුණි . කන්ද තිබුනේ පාසලට පෙනෙන දුරිනි. නමුත් එහි පාමුලට ලගා වීමට ඔවුන්ට අඩු තරමින් කිලෝමීටර් 2ක් කැලය මැදින් ගමන් කිරීමට තිබුණි (sight - දර්ශනය , පෙනීම ) (foot - පය , පාමුල )

People say that an ancient king lived in a palace at the top of this mountain. He was hiding from his enemies.
පීපල් සේ දැට් ඇන් ඒන්ෂන්ට් කිං ලිව්ඩ් ඉන් අ පැලස් ඇට් ද ටොප් ඔෆ්(ටොපොෆ් ) දිස් මවුන්ටන් .හී වෝස් හයිඩිං ෆ්‍රොම් හිස් එනිමීස් (ancient - පුරාණ )(enemy - සතුරා / enemies- සතුරන් )

මේ කන්ද මුදුනේ මාලිගාවක පුරාන රජ කෙනෙක් ජීවත් වූ බව මිනිස්සු කියති . ඔහු ඔහුගේ සතුරන්ගෙන් සැඟවෙමින් සිටියේය.

Finally, his enemies discovered his hiding place and came to capture him. According to the story, the king and his wives jumped off a boulder at the top of the mountain to their deaths. That boulder is called "Kalugala."

ෆයිනලි හිස් එනිමීස් ඩිස්කව(ර්)ඩ් හිස් හයිඩිං ප්ලේස් ඇන්ඩ් කේම් ටු කැප්ච(ර්) හිම්. අකෝඩින් ටු ද ස්ටෝරි , ද කිං ඇන්ඩ් හිස් වයිව්ස් ජම්ප්ඩ් ඕෆ් අ බෝල්ඩ(ර්) ඇට් ද ටොප් ඔෆ් ද මවුන්ටන් ටු දෙයා(ර්) ඩෙත්ස්. දැට් බෝල්ඩ(ර්) ඉස් කෝල්ඩ් “කළුගල”

අවසන, ඔහුගේ සතුරෝ ඔහු සැඟවී සිටි තැන සොයා ගත් අතර ඔහුව අල්ලා ගැනීමට පැමිණියහ. කතාවට අනුව, රජ සහ ඔහුගේ බිරින්දෑවරුන් කඳු මුදුනේ වූ පර්වතයකින් පැන මරණයට පත් වූහ .කලුගල යනුවෙන් හැඳින්වුයේ එම පර්වතයයි (discover- සොයා ගන්නවා )

It is said that one can see the sea from the top of Kalugala.According to folklore, only a few people have been able to reach the top of the mountain and return unharmed
ඉට් ඉස් සේඩ් දැට් වන් කැන් සී ද සී ෆ්‍රොම් ද ටොප් ඔෆ් (ටොපොෆ් ) කළුගල. අකෝඩින් ටු ද ෆෝක්ලෝ ,ඔන්ලි අ ෆිව් පීපල් හැව් බීන් ඒබල් ටු රීච් ද ටොප් ඔෆ් ද මවුන්ටන් ඇන්ඩ් රිට(ර්)න් අන්හාම්ඩ්.

කළුගල මත සිට යමෙකුට මුහුද දැකිය හැකි යැයි කියවේ . ජනප්‍රවාදයට අනුව , කඳු මුදුනට ලගා වී , හානියක් නැතිව නැවත පැමිණීමට හැකි වී තිබෙන්නේ කිහිප දෙනෙකුට පමණි (folklore - ජනප්‍රවාදය , ප්‍රජාවක් අතර පැතිර පවතින කටින් කට එන කතන්දර )

It is believed that nobody can go higher than a certain point, known as the circular road. This circular road is near the top.
ඉට් ඉස් (ඉටිස් )බිලීව්ඩ් දැට් නෝබොඩි කැන් ගෝ හය(ර්) දෑන් අ ස(ර්)ට්න් පොයින්ට්, නෝව්න් ඈස් ද ස(ර්)කියුල(ර්) රෝඩ්. දිස් ස(ර්)කියුල(ර්) රෝඩ් ඉස් නිය(ර්) ද ටොප්

රවුම් පාර යනුවෙන් දන්නා යම් නිශ්චිත ස්ථානයකට වඩා ඉහලට කිසිවෙකුට යා නොහැකි බව විශ්වාස කෙරුනි. මෙම රවුම් පාර තිබෙන්නේ කඳු මුදුනට ලංවය (circular - වටරවුම් , වෘත්තාකාර )

If anyone tries to go higher, they will always be walking along the circular road. If anyone actually climbs beyond the circular road and reaches the top, they will not return without injury or illness. These stories always fascinated the boys.
ඉෆ් එනිවන් ට්‍රයිස් ටු ගෝ හය(ර්) , දේ විල් ඕල්වේස් බී වෝකිං අලෝන් ද ස(ර්)කියුල(ර්) රෝඩ් . ඉෆ් එනිවන් ඇක්චුවලි ක්ලයිම්ස් බියොන්ඩ් ද ස(ර්)කියුල(ර්) රෝඩ් ඇන්ඩ් රීචස් ද ටොප්, දේ විල් නොට් රිට(ර්)න් විතවුට් ඉන්ජරි ඕ ඉල්නස්. දීස් ස්ටෝරීස් ඕල්වේස් ෆැසිනේටඩ් ද බෝයිස්

යමෙකු ඊට වඩා ඉහලට යාමට උත්සාහ කළහොත් ඔවුන් සැමවිටම රවුම් පාරේම ඇවිදිමින් සිටිනු ඇත. යමෙකු ඇත්තටම රවුම් පාරෙන් ඉහලට නැග මුදුනට ලගා වුවහොත් , ඔවුන් තුවාලයක් හෝ අසනීපයක් නොමැතිව ආපසු නොපැමිණෙනු ඇත . මේ කතන්දර නිතරම මේ ළමුන් වසඟ කළේය (injury - තුවාලය , ශාරීරික හානිය) (illness - අසනීපය )(fascinate - වසඟ කරනවා , ආකර්ෂණය කරනවා )

Once, they met an uncle living nearby the  school . He had made the journey to Kalugala and back. The boys asked him if it was very dangerous to climb the mountain.
වන්ස් , දේ  මෙට් ඇන් අංකල් ලිවිං නියර්) බයි ද ස්කූල්  . හී හැඩ්  මේඩ් ද ජ(ර්)නි ටු කළුගල ඇන්ඩ් බැක්. ද බෝයිස් ආස්ක්ඩ් හිම් ඉෆ් ඉට් වෝස් වෙරි ඩේන්ජරස් ටු ක්ලයිම් ද මවුන්ටන්

වරක් ඔවුනට පාසල අසල  ජීවත් වන මාමා  කෙනෙකු මුන ගැසුණි. ඔහු කලුගලට ගොස්  ආපසු පැමිනීමේ ගමන  කර තිබුණි . කන්ද නැගීම ඉතා අනතුරුදායක දැයි ළමුන් ඔහුගෙන් විමසූහ

"There will be no harm if you behave well," He said. "Most of the stories about Kalugala are false," He added. The boys had wanted to climb the mountain ever since.
“දෙයා(ර්) විල් බී නෝ හාම් ඉෆ් යු බිහේව් වෙල්” හී සේඩ් . මෝස්ට් ඔෆ් ද ස්ටෝරීස් අබවුට් කළුගල ආ ෆෝල්ස් “ හී  ඇඩඩ්. ද බෝයිස් හැඩ්  වෝන්ටඩ් ටු ක්ලයිම් ද මවුන්ටන් එව(ර්) සින්ස්

“ඕගොල්ලෝ හොදට හැසිරුනොත් කිසිම හානියක් නැහැ “. ඔහු කීවේය. “කළුගල ගැන ගොඩක් කතා බොරු “. ඔහු තවදුරත් කීවේය . එතැන් සිටම මේ පිරිමි ලමුන්ට කන්ද නැගීමට ඕනෑ වී  තිබුණි

Finally, they selected a date for their adventure, the same day other students of their grade went on a trip to Colombo.
ෆයිනලි දේ සිලෙක්ටඩ්  අ ඩේට් ෆෝ දෙයා(ර්) ඇඩ්වෙන්ච(ර්) , ද
සේම්  ඩේ  අද(ර්)  ස්ටුඩන්ට්ස් ඔෆ් දෙයා(ර්) ග්‍රේඩ් වෙන්ට් ඔන්  අ ට්‍රිප් ටු කලම්බු

අවසන . ඔවුන් මේ වීර ක්‍රියාව සදහා දිනයක් තෝරා ගත්හ .ඒ ඔවුන්ගේ ශ්‍රේණියේ අනෙකුත් ශිෂ්‍යයන් කොළඹට විනෝද චාරිකාවක් ගිය දිනයයි .

They started off at about 8:30 am . It had rained for the last three or four days, but that morning the sun was shining, much to their delight.
දේ ස්ටාටඩ් ඕෆ් ඇට්  අබවුට් එයිට් ත(ර්)ටි ඒ එම් . ඉට්  හැඩ්  රේන්ඩ් ෆෝ ද ලාස්ට් ත්‍රී ඕ ෆෝ ඩේස්, බට් දැට් මෝනිං ද  සන් වෝස්  ශයිනිං , මච්  ටු දෙයා(ර්) ඩිලයිට්.

උදෑසන 8.30 ට පමණ ඔවුන් ආරම්භ කළහ .පසුගිය දින තුන හතර වැසි
වැටී  තිබුණි  නමුත් ඒ උදෑසන , ඔවුන්ගේ මහත් ප්‍රීතියට, හිරු බැබලෙමින් තිබුණි
(delight  - ප්‍රීතිය , සතුට )

They had to find a way through the jungle, It was not easy, but the boys were determined. Three out of the four were boy scouts, so they were trained to take up challenges.
දේ හෑඩ් ටු ෆයින්ඩ් අ වේ ත්රෑ ද ජංගල් , ඉට් වෝස් නොට් ඊසි , බට් ද බෝයිස් ව(ර්) ඩිට(ර්)මින්ඩ්. ත්‍රී අවුට් ඔෆ් ෆයිව් ව(ර්) බෝයි ස්කවුට්ස් , සෝ දේ ව(ර්) ට්‍රේන්ඩ් ටු ටේක් අප් චැලෙන්ජස්

ඔවුන්ට කැලය තුලින් මාර්ගය පාදා ගැනීමට සිදුවිය , එය පහසු නොවීය. එහෙත් ළමෝ අධිෂ්ඨාන සහගත වූහ . පිරිමි ළමුන් හතර දෙනාගෙන් තිදෙනෙක් බාල දක්ෂයන් වූහ .ඒ නිසා ඔවුන් අභියෝග බාර ගැනීමට පුහුණු වී සිටියහ (determined - අධිෂ්ටානශීලි )(challange - අභියෝගය )

For the first half hour, they passed through a thick jungle. The next half hour was not as difficult; they walked through small thickets, grasslands, and sometimes farm lands.
ෆෝ ද ෆස්ට් හාෆ් අව(ර්) , දේ පාස්ඩ් ත්රෑ අ තික් ජංගල් . ද නෙක්ස්ට් හාෆ් අව(ර්) වෝස් නොට් ඇස් ඩිෆිකල්ට් , දේ වෝක්ඩ් ත්රෑ ස්මෝල් තිකිට්ස් ,ග්‍රාස් ලෑන්ඩ්ස් ඇන්ඩ් සම්ටයිම්ස් ෆාම් ලෑන්ඩ්ස් .

පළවැනි පැය භාගය ඔවුන් ගමන් කලේ ඝන කැලෑවක් මැදිනි . ඊලග පැය භාගය එතරම්ම දුෂ්කර නොවීය .ඔවුන් කුඩා ලඳු කැලෑ , තන බිම් සහ ඇතැම්විට ගොවිබිම් හරහා ගමන් කළහ (thick - ඝන )(thicket - ලඳු කැලෑව) (grassland -තන බිම)(farm land - ගොවි බිම )

When they reached the foot of the mountain, it was about 9:45 am . The boys were so excited. So they began climbing without taking a rest.
වෙන් දේ රීච්ඩ් ද ෆුට් ඔෆ් ද මවුන්ටන්, ඉට් වෝස් අබවුට් නයින් ෆෝටි ෆයිව් ඒ එම් . ද බෝයිස් ව(ර්) සෝ එක්සයිටඩ්. සෝ දේ බිගෑන් ක්ලයිම්ං විතවුට් ටේකිං අ රෙස්ට්

ඔවුන් කන්ද පාමුලට ලඟා වනවිට 9.45 පමණ වී තිබුණි .පිරිමි ළමුන් මහත් උද්යෝගයට පත්ව සිටියහ . එනිසා ඔවුන් විවේකයක් නොගෙනම කන්ද නැගීම ආරම්භ කළහ (foot - පය / පාමුල ) (excited - උද්යෝගයට පත් )

By 11:45 am , they had reached the circular road. It was a narrow path and it encircled the hill. It was clear that the road was man-made.
බයි ඉලෙවන් ෆෝටි ෆයිව් ඒ එම් , දේ හෑඩ් රීච්ඩ් ද ස(ර්)කියුල(ර්) රෝඩ් ,
ඉට් වෝස් අ නැරෝ පාත් ඇන්ඩ් ඉට් එන්ස(ර්)කල්ඩ් ද හිල්. ඉට් වෝස් ක්ලිය(ර්) දැට් ද රෝඩ් වෝස් මෑන් මේඩ්

11.45 වනවිට ඔවුන් රවුම් පාරට ලගා වී තිබුණි . එය කන්ද වටා ගිය පටු මාවතක් විය . එය මිනිසුන් විසින් නිර්මාණය කල එකක් බව පැහැදිලි විය (narrow - පටු )(encircle - වට කරනවා )

The surroundings were beautiful. They could see far into the distance. They could see their school and part of the town, as well as mountain ranges far away.
ද සරවුන්ඩිංග්ස් ව(ර්) බියුටිෆුල්; දේ කුඩ් සී ෆා ඉන්ටු ද ඩිස්ටන්ස් . දේ කුඩ් සී දෙයා ස්කූල් ඇන්ඩ් පාට් ඔෆ් ද ටවුන් ,ඈස් වෙල් ඈස් මවුන්ටන් රේන්ජස් ෆා අවේ .

වට පිටාව බෙහෙවින් සුන්දර විය . දුර ඈත තෙක් ඔවුන්ට දැක ගත හැකිවිය .ඔවුන්ට ඔවුනේ පාසල සහ නගරයේ කොටසක් මෙන්ම බොහෝ ඈත කඳු පන්තීන්ද දැකගත හැකි විය (surroundings - වටපිටාව )(mountain ranges - කඳු පන්ති )

From this point, it was about another 30-minute climb to the top. By now, they were tired and a bit hungry. But they decided it was too early for lunch . They just needed a rest and some tea before starting the final climb
ෆ්‍රොම් දිස් පොයින්ට් , ඉට් වෝස් අබවුට් අනද(ර්) ත(ර්)ටි මිනිට්ස් ක්ලයිම් ටු ද ටොප්. බයි නව් ,දේ ව(ර්) ටය(ර්)ඩ් ඇන්ඩ් අ බිට් හංග්‍රි . බට් දේ ඩිසයිඩඩ් ඉට් වෝස් ටූ අ(ර්)ලි ෆෝ ලන්ච්. දේ ජස්ට් නීඩඩ් අ රෙස්ට් ඇන්ඩ් සම් ටී බිෆෝ ස්ටාටිං ද ෆයිනල් ක්ලයිම්

මේ ස්ථානයේ සිට මුදුනට තවත් මිනිත්තු 30 ක පමණ නැගීමක් විය .මේ වනවිට ඔවුන් වෙහෙසට පත්ව තිබුණු අතර ඔවුන්ට මදක් බඩගිනි දැනුනි .නමුත් ඔවුන් තීරණය කලේ දිවා ආහාරය සදහා වේලාසන වැඩි බවයි . ඔවුන්ට අවශ්‍ය වුයේ , අවසන් නැග්ම ආරම්භ කිරීමට කලින් , විවේකයක් සහ තේ ටිකක් පමණි .

They gathered sticks to make a fire. Shamal had brought some tea, Dinal had some sugar, and Ashen had brought some biscuits
දේ ගැද(ර්)ඩ් ස්ටික්ස් ටු මේක් අ ෆය(ර්) . ශමල් හැඩ් බ්‍රෝට් සම් ටී .දිනාල් හැඩ් සම් ෂුග(ර්) ඇන්ඩ් අශේන් හැඩ් බ්‍රෝට් සම් බිස්කට්ස්.

ඔවුන් ගිනි මැලයක් දැල්වීමට දර කෝටු එක්රැස් කළහ .ශමල් තේ කොළ ගෙනවිත් තිබුණි .දිනාල් ලග සීනි තිබුණි .අශේන් ලග බිස්කට් වගයක් විය (gather - එකතු කරනවා , එකතු වෙනවා ) (sticks - කෝටු )

When they had stacked the sticks and were ready to light a fire, they realized that Nadun was supposed to bring a box of matches. Since he hadn’t come, they could not light a fire. Then they also realized he had undertaken to bring bread for lunch.
වෙන් දේ හැඩ් ස්ටැක්ඩ් ද ස්ටික්ස් ඇන්ඩ් ව(ර්) රෙඩි ටු ලයිට් අ ෆය(ර්) , දේ රියලයිස්ඩ් දැට් නදුන් වෝස් සපෝස්ඩ් ටු බ්‍රිං අ බොක්ස් ඔෆ් මැචස් . සින්ස් හී හැඩ්න්ට් කම් , දේ කුඩ් නොට් ලයිට් අ ෆය(ර්) . දේ ඕල්සෝ රියලයිස්ඩ් හී හැඩ් අන්ඩටේකන් ටු බ්‍රිං බ්‍රෙඩ් ෆෝ ලන්ච්

ඔවුන් දර කෝටු ගොඩ ගසා ගිනි මැලය දැල්වීමට සුදානම් වත්ම , නදුන් ගිනි පෙට්ටියක් රැගෙන ඒමට සිටි බව ඔවුන්ට අවබෝධ විය . ඔහු නොපැමිණි නිසා ඔවුන්ට ගින්නක් දැල්විය නොහැක . ඊලගට ඔවුන්ට අවබෝධ වූයේ ඔහු දිවා ආහාරය සදහා පාන් රැගෙන ඒමටද බාරගෙන තිබුණු බවයි (stack - ගොඩ ගහනවා )(stickස -

කෝට්ටු )(matches - ගිනි කූරු ) (light - දල්වනවා, පත්තු කරනවා )(undertake - යමක් කරන්න බාර ගන්නවා ) (since - නිසා )

………..

ඉතාම ලස්සන වාක්‍යයන් ගෙන් පිරුණු කතාවක් මෙය . ඒ හැම වාක්‍යයක්ම ඉතාම වැදගත් . ඒවා හොඳින් හදාරන්න . ඒ වගේම පහත වාක්‍යය විශේෂයෙන් මතක තියා ගන්න

I waited for an hour. Finally, I decided to come without him
අයි වේටඩ් ෆෝ ඇන් අව(ර්) . ෆයිනලි අයි ඩිසයිඩඩ් ටු කම් විතවුට් හිම්
මම පැයක්  බලන් හිටියා , අන්තිමට එයා නැතුව මම එන්න තීරණය කළා

What can we do now ?
වට්  කැන් වී ඩූ නව් ?
දැන් අපි මොකද කරන්නේ ?

What if he comes here after we have left?
වට්  ඉෆ් හී කම්ස් හියර්) ආෆ්ට(ර්) වී හැව්  ලෙෆ්ට්
අපි ගියාට පස්සේ එයා ආවොත් මොකද වෙන්නේ ?

We shouldn’t wait anymore
වී ෂුඩ්න්ට් වේට්  එනිමෝ
අපි තවත් බලන් ඉන්න ඕන නෑ

We have to come back before nightfall.
වී හැව් ටු කම්  බැක් බිෆෝ නයිට් ෆෝල්
රෑ  වෙන්න කලින් අපි එන්න ඕනා

The mountain was within sight of their school
ද මවුන්ටන් වෝස් විතින් සයිට් ඔෆ් දෙයා(ර්) ස්කූල්
කන්ද තිබුනේ පාසලට පෙනෙන දුරිනි

He was hiding from his enemies.
හී වෝස් හයිඩිං ෆ්‍රොම් හිස් එනිමීස්
ඔහු ඔහුගේ සතුරන්ගෙන් සැඟවෙමින් සිටියේය

There will be no harm if you behave well
දෙයා(ර්) විල් බී නෝ හාම් ඉෆ් යු බිහේව් වෙල්
ඕගොල්ලෝ හොඳට හැසිරුනොත් කිසිම හානියක් නැහැ

It  was not easy, but the boys were determined
ඉට්  වෝස් නොට්  ඊසි , බට් ද බෝයිස් ව(ර්)  ඩිට(ර්)මින්ඩ්
එය පහසු නොවීය. එහෙත් ළමෝ අධිෂ්ඨාන සහගත වූහ

They could see far into the distance
දේ කුඩ් සී ෆා  ඉන්ටු ද ඩිස්ටන්ස්
දුර ඈත තෙක් ඔවුන්ට දැක ගත හැකිවිය

By now, they were tired and a  bit hungry
බයි නව් ,දේ  ව(ර්) ටය(ර්)ඩ් ඇන්ඩ්  අ බිට් හංග්‍රි
මේ වනවිට ඔවුන් වෙහෙසට පත්ව තිබුණු අතර ඔවුන්ට මදක් බඩගිනි දැනුනි

They decided it was too early for lunch
දේ ඩිසයිඩඩ් ඉට්  වෝස් ටූ අ(ර්)ලි ෆෝ ලන්ච්
 ඔවුන් තීරණය කලේ දිවා ආහාරය සඳහා වේලාසන වැඩි බවයි

They just needed a rest and some tea
දේ ජස්ට් නීඩඩ් අ රෙස්ට් ඇන්ඩ් සම් ටී
ඔවුන්ට අවශ්‍ය වුයේ විවේකයක් සහ තේ ටිකක් පමණි .

They  gathered sticks to make a fire
දේ ගැද(ර්)ඩ් ස්ටික්ස් ටු මේක්  අ ෆය(ර්)
ඔවුන් ගිනි මැලයක් දැල්වීමට දර කෝටු  එක්රැස් කළහ

**Vocabulary 67**

Mysterious - මිස්ටීරියස් - අභිරහස් , ගුප්ත
Gosh - ගොෂ් -  විස්මය , බලාපොරොත්තු කඩවීම, අප්‍රසාදය අඟවන ආලාපයක්
surely - ෂුව(ර්)ලි - නිසැකවම

permit - ප(ර්)මිට් - අවසර දෙනවා
quite - ක්වයිට් - තරමක්
puzzle - පස්ල් - ප්‍රහේලිකාව
puzzled - පස්ල්ඩ් - අවුලට පත් , ව්‍යාකූල වූ
nightfall - නයිට්ෆෝල් - රාත්‍රිය උදාවීම
dark fall - ඩාක්ෆෝල් - අඳුර වැටීම
never mind - නෙව(ර්) මයින්ඩ් - කමක් නැහැ , ගානක් නැහැ
enemy - එනිමි - සතුරා (බහු - enemies )
sight - සයිට් - දර්ශනය
within sight ඔෆ් ... - විතින් සයිට් ඔෆ් ... - පේන මානයේ
hide - හයිඩ් - හැංගෙනවා හංගනවා
palace පැලස් - මාලිගය
through ත්‍රෘ - හරහා
foot - ෆූට් - පය , පාමුල
discover - ඩිස්කව(ර්) - සොයා ගන්නවා
hiding place - හයිඩිං ප්ලේස් - සැඟවුණු තැන
capture - කැප්ච(ර්) - අල්ලා ගන්නවා
according to ... - අකෝඩිං ටු... - අනුව ...
jump - ජම්ප් - පනිනවා
boulder - බෝල්ඩ(ර්) - පර්වතය
top - ටොප් - මුදුන
death - ඩෙත් - මරණය
folklore - ෆෝක්ලෝ - ජනප්‍රවාදය , ජනකතා
reach - රීච් - ලඟා වෙනවා
return - රිට(ර්)න් - ආපසු එනවා , ආපසු දෙනවා
unharmed - අන්හාම්ඩ් - හානියක් නැතුව
higher - හය(ර්) - තවත් ඉහලට
certain - ස(ර්)ටන් - යම් නිශ්චිත

point - පොයින්ට් - තැන , ස්ථානය

circular - ස(ර්)කියුල(ර්) - රවුම් , චක්‍රාකාර

beyond - බියොන්ඩ් - එහා එපිට

without - විතවුට් - හැර , නොමැතිව

injury - ඉන්ජරි - ශාරීරික හානිය

fascinate -ෆැසිනේට් - සිත් බඳවනවා, සිත් වසඟ කරනවා

behave - බිහේව් - හැසිරෙනවා

false - ෆෝල්ස් - වැරදි

ever since - එව(ර්) සින්ස් - එදා සිටම , එතැන් සිටම

start off - ස්ටාට් ඕෆ් - ගමන් ආරම්භ කරනවා

delight - ඩිලයිට් - ප්‍රීතිය , සතුට

determined - ඩිට(ර්)මින්ඩ් - අධිෂ්ටානශීලී

scout - ස්කවුට් - බාලදක්ෂයා

train - ට්‍රේන් - පුහුණු කරනවා

trained - ට්‍රේන්ඩ් - පුහුණු වූ , පුහුණුව ලත්

challenge - චැලෙන්ජ් - අභියෝගය

pass - පාස් - පසු කර යනවා

thick - තික් - ඝන

thicket - තිකිට් - ලඳු කැළෑව

grassland - ග්‍රාස් ලෑන්ඩ් - තණබිම

farm - ෆාම් - ගොවිපල

farm land - ෆාම් ලෑන්ඩ් - ගොවි බිම

excited - එක්සයිටඩ් - උද්යෝගයට පත්

narrow - නැරෝ - පටු

encircle - එන්ස(ර්)කල් - වට කරනවා

man made - මැන් මේඩ් - මිනිසා විසින් සාදන ලද

surrounding - සරවුන්ඩිං - අවට , වට පිට

surroundings - සරවුන්ඩිංස් - වටපිටාව

mountain range - මවුන්ටන් රේන්ජ් - කඳු වළල්ල

stick - ස්ටික් - කෝටුව

fire - ෆය(ර්) - ගින්දර , ගින්න

stack - ස්ටැක් - ගොඩ ගහනවා

light - ලයිට් - පත්තු කරනවා

light a fire - ලයිට් අ ෆය(ර්) - ගින්නක් පත්තු කරනවා

supposed - සපෝස්ඩ් - අපේක්ෂිත (ඇතැම් ව්‍යාකරණ රටා වල “එසේ කරනු ලැබේ යැයි අපේක්ෂා කල” යන අර්ථය දීමට භාවිතා වේ )

match - මැච් - ගිනිකූර

box of matches - බොක්ස් ඔෆ් මැචස් - ගිනි පෙට්ටිය

since - සින්ස් - නිසා

undertake - අන්ඩ(ර්)ටේක් - බාර ගන්නවා